# ථේරවාදයේ හා මහායානයේ ඉගැන්වෙන බෝධිසත්ව සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

කරපික්කඩ සෝභිත හිමි[1], මැදවච්චියේ සංඝානන්ද හිමි[2]

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ප්‍රධාන වශයෙන් ථේරවාද හා මහායාන යනුවෙන් ගුරු කුල දෙකක් බිහි විය. ආදි බෞද්ධ ඉගැන්වීම් මූලික කරගනිමින් තමන්ට ආවේණික වූ අර්ථ කථනයන් ඉදිරිපත් කරන්නට මෙම ගුරු කුලයන්හි ප්‍රධානාචාර්යවරුන් යොමු වූහ. ථේරවාදීන්ට අනුව කෙලෙස් නිවීම සඳහා රහත් බව හා බුදු බව අතර වෙනසක් නොමැත. නමුත් මහායානිකයන් පවසන්නේ රහත් බව යනු පහත් තත්ත්වයක් බවත්, බෝධිසත්ව යනු උසස් තත්ත්වයක් බවත් ය. ඒ අනුව ථේරවාදීන්ගේ හා මහායානිකයන්ගේ බෝධිසත්ව සංකල්පය පිළිබඳ ඉගැන්වීම් අතර සම විෂමතා මොනවාද යන්න පිළිබඳව මෙම පර්යේෂණය සිදු කරනු ලබයි. ගුණාත්මක භාවයෙන් යුක්ත පර්යේෂණයක් සිදු කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍රයන් පාදක කරගනිමින්, එම දත්තයන් විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කරනු ලබයි. 'බෝධිසත්ව' යන්න බුදුදහමේ වැදගත් භූමිකාවකි. බුද්ධත්වය සඳහා පෙරුම් පුරන බුද්ධාංකුරයා බෝධිසත්ව නාමයෙන් හැඳින් වේ. ඔහු ජාති, ජරා ආදි දුක්වලින් පීඩිතව සසර සැරි සැරීම ගැන කලකිරී එයින් මිදීම සඳහා පාපයෙන් වෙන් වී කුසල් දහම් වඩමින් බුද්ධත්වය තුළින් නිර්වාණයට අවශ්‍ය පාරමිතා සම්පූර්ණ කරමින් සසර සැරිසරන තැනැත්තෙකි. ථේරවාදීන්ට අනුව බුද්ධත්වය ප්‍රාර්ථනා කර ඒ සඳහා අවශ්‍ය පාරමිතා සම්පූර්ණ කරන තැනැත්තා බෝධිසත්ව නාමයෙන් හඳුන්වයි. බුදු, පසේ බුදු හා රහත් යන තුන් බෝධියෙන් පසු සිව්වන ස්ථානය බෝධිසත්වවරයාට ථේරවාදීන් ලබා දී ඇත. බුද්ධත්වය සඳහා සිතින් ප්‍රාර්ථනා කිරීම මනෝ ප්‍රණිධිය ලෙසත්, වචනයෙන් ප්‍රාර්ථනා කිරීම වාග් ප්‍රණිධිය ලෙසත්, බුදු කෙනෙකුගෙන් එම බුදුවීමේ ප්‍රාර්ථනාව ස්ථිරවම සිදුවන බව ප්‍රකාශ වීම නියත විවරණ ලැබීම ලෙසත් හැඳින් වේ. නියත විවරණ ලැබීම සඳහා කරුණු 8ක් සම්පූර්ණ විය යුතු බව බුද්ධ වංශයේ සඳහන් වේ. එමෙන් ම දස පාරමිතා පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී යනාදි වශයෙන් පූරණය කළ යුතු ය. මහායානිකයන්ට අනුව බෝධිසත්වවරයා දෙවැනි වන්නේ බුදුන් වහන්සේට පමණි. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන සියලු දෙනා ම බෝධිසත්වවරුන් වන්නේ ය. බුද්ධත්වය සඳහා සම්පූර්ණ කළ යුතු පාරමී ගණන 6කි. තව ද දශ භූමි නමින් හැඳින්වෙන උතුම් ගුණ දහම් ඇති කරගත යුතුය. මහායාන ප්‍රධාන බෝධිසත්වවරුන් ලෙස අවලෝකිතේශ්වර, ආකාශගර්භ, වජ්‍රගර්භ, ක්ෂිතිගර්භ, සර්වනිවාරණ, විෂ්කම්බින්, සමන්තභද්‍ර, මංජු ශ්‍රී යන බෝසත්වරුන් දැක්විය හැකිය. මහායානිකයන්ගේ බෝධිසත්ව සංකල්පය පිළිබඳ තොරතුරු සද්ධර්මපුණ්ඩරීක හා දශභූමික සූත්‍රයන් තුළ දැකිය හැකිය. එනයින් බලන කල ථේරවාදයේ හා මහායානයේ බෝධිසත්ව සංකල්පය පිළිබඳ ඉගැන්වීම් තුළ බොහෝ විෂමතා ඇති අතර, සමානතාවයක් ඇත්තේ බුද්ධත්වයට පත්වීම පමණි.

**යතුරු පද:-** ථේරවාදය, මහායානය, බෝධිසත්ව සංකල්පය, බුද්ධ වංශය, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය

---

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.
[2] තාවකාලික නිබන්ධ උපදේශක, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.



CamScanner